# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2025 දෙසැම්බර් මස 12 වන දින

## II වන කොටස

## අතිරේකය

(2025.12.12 දින නිකුත් කරන ලදී)

## කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ

**කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන් ව්‍යාපාර පවත්වාගෙනයාම නියාමනය කිරීම සහ පාලනය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද, විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 72.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ

එල්.ඩී.- ඕ 58/2023

**කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ගේ ව්‍යාපාර පවත්වාගෙනයාම නියාමනය කිරීම සහ පාලනය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද, විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2025 අංක  දරන කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

I වන කොටස

### කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීම

කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීම

**2.** (1) යම් තැනැත්තකු විසින්, (මේ පනතේ "අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරනු ලබන වෙළඳ නැව් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන වලංගු බලපත්‍රයක අධිකාරය යටතේ හැර, කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවකුගේ ව්‍යාපාරයක් මෙහෙයවීම, එවැනි ව්‍යාපාරයක නිරත වීම හෝ එවැනි ව්‍යාපාරයක් කරගෙන යාම නොකළ යුතු ය.

(2) කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවකුගේ ව්‍යාපාරය සම්බන්ධයෙන් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ වන ස්වකීය අධිකාරී බලය, ලිඛිතව වෙනත් නිලධරයකුට පැවරීමේ බලය අධ්‍යක්ෂ-ජනරාල්වරයාට තිබිය යුතු ය.

කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවකුගේ ව්‍යාපාර කරගෙන යාම සඳහා බලපත්‍ර ලබා දීම

**3.** (1) මේ පනතේ විධිවිධාන යටතේ කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවකුගේ ව්‍යාපාරය කරගෙන යාමට අදහස් කරනු ලබන තැනැත්තකු, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක් විය යුතු ය.

PL 15512 - 465 (2025/11)

(2) (1) වන උපවගන්තිය යටතේ සඳහන් කරන ලද සමාගමක් විසින්, බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා, නියම කරනු ලැබිය හැකි ආකෘතියකින් අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම ඉල්ලීමක ම, අවශ්‍ය සියලුම විස්තරවල සම්පූර්ණ සහ නිවැරදි තොරතුරු අන්තර්ගත විය යුතු අතර, නියම කරන ලද ගාස්තුව සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, (2) වන උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක අන්තර්ගත තොරතුරු සහ විස්තර සලකා බලා සහ, බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා නියම කරනු ලැබිය හැකි යෝග්‍යතාවට අදාළ අවශ්‍යතා ඉල්ලුම්කරු විසින් සම්පූර්ණ කරනු ලැබ ඇති අවස්ථාවක දී, එකී බලපත්‍රය ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) ව්‍යාජ, නොමඟ යවන සුලු හෝ අසත්‍ය තොරතුරු හෝ විස්තර අන්තර්ගත බවට සොයා ගනු ලබන ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

බලපත්‍රයේ ආකෘතිය සහ එය බලපවත්නා කාලය

**4.** (1) 3 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් -

(අ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියේ විය යුතු ය;

(ආ) බලපත්‍රයේ නිශ්චිතව දක්වනු ලබන පරිදි යම් නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු ය;

(ඇ) බලපත්‍රයේ නිශ්චිතව සඳහන් කරන ලද දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය; සහ

(ඈ) කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, බලපත්‍රයේ නිශ්චිතව දක්වනු ලබන කාල සීමාවක් සඳහා වලංගු විය යුතු ය.

(2) අදාළ බලපත්‍රලාභියාට වන්දි ගෙවීමකින් තොරව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් බලපත්‍රයේ නියම සහ කොන්දේසි වෙනස් කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ වන කිසිදු වෙනස් කිරීමක්, එකී වෙනස් කිරීම සිදු නොකළ යුත්තේ ඇයි ද යන්න සම්බන්ධයෙන් වන හේතු, එකී දැනුම්දීමේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කාලසීමාවක් තුළ දක්වන ලෙසට වන ලිඛිත දැනුම්දීමක් බලපත්‍රලාභියා වෙත කරනු ලැබීමෙන් පසු සහ, බලපත්‍රලාභියා විසින් එම කාලසීමාව තුළ හේතු දැක්වීමට අපොහොසත් වීම හෝ ඔහු විසින් ප්‍රමාණවත් හේතු දැක්වීමක් නොකිරීම මත හැර, කරනු නොලැබිය යුතු ය.

බලපත්‍රය පැවරීම සීමා කිරීම

**5.** මේ පනතේ විධිවිධාන යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් සහ එකී බලපත්‍රය යටතේ වන යම් අයිතිවාසිකම්, ප්‍රතිලාභ හෝ වරප්‍රසාද වෙනත් යම් තැනැත්තකු වෙත පැවරීම හෝ මාරු කිරීම නොකළ යුතු අතර, වෙනත් යම් තැනැත්තකුගේ ප්‍රතිලාභය සඳහා භාවිත නොකළ යුතු ය.

අලුත් කිරීම

**6.** (1) 3 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක්, එහි කාලය ඉකුත්වීමට දින තිහකට නොඅඩු කාලයකට පෙර, තත්කාර්ය සඳහා නියම කරනු ලැබිය හැකි ආකෘතියකින් සහ නියමිත අලුත් කිරීමේ ගාස්තුව ද සමග අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මත, අලුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසුව -

(අ) බලපත්‍රලාභියා විසින්, නිකුත් කරන ලද බලපත්‍රයේ නියම සහ කොන්දේසි කඩකර නොමැති හෝ එකී නියම සහ කොන්දේසි උල්ලංඝනය කරමින් කිසිවක් සිදුකර නොමැති අවස්ථාවක දී;

(ආ) බලපත්‍රලාභියා විසින්, මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන උල්ලංඝනය කර නොමැති අවස්ථාවක දී; හෝ

(ඇ) අදාළ කන්ටේනර් ඩිපෝ මෙහෙයුම දිගටම කරගෙන යාම මගින් මහජනයාට යම් අහිතකර බලපෑමක් සිදු නොවන අවස්ථාවක දී,

අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් බලපත්‍රයක් අලුත් කරනු ලැබිය හැකි ය.

(3) මේ පනතේ 3 වන වගන්තියේ විධිවිධාන, මේ වගන්තිය යටතේ අලුත් කිරීම මත නිකුත් කරන ලද බලපත්‍රයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

බලපත්‍රයක් අත්හිටුවීම

**7.** (1) මේ පනතේ 3 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් -

(අ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ගනු ලබන තීරණයක ප්‍රතිඵලයක් වශයෙන් ආරක්ෂක පියවර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන අවස්ථාවක දී;

(ආ) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන යටතේ වූ වරදක් කිරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභියා චෝදනා ලැබ ඇති අවස්ථාවක දී; හෝ

(ඇ) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගවල විධිවිධානයක් බලපත්‍රලාභියා විසින් උල්ලංඝනය කරනු ලැබ ඇති විට සහ එම උල්ලංඝනය කිරීම බලපත්‍රය අවලංගු කිරීමට තරම් ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී,

අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අත්හිටුවනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ බලපත්‍රයක් අත්හිටුවනු ලැබූ අවස්ථාවක දී, එකී බලපත්‍රය නිකුත් කිරීම සඳහා බලපත්‍රලාභියා විසින් ගෙවන ලද ගාස්තුවෙන් ප්‍රමාණානුකූල මුදලක් ආපසු ලබා ගැනීමට බලපත්‍රලාභියාට හිමිකමක් තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වන කිසිදු අත්හිටුවීමක්, එකී අත්හිටුවීම සිදු නොකළ යුත්තේ මන්දැයි යන්න සම්බන්ධයෙන් වන හේතු, එකී දැන්වීමේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කාලසීමාවක් තුළ දක්වන ලෙසට වන ලිඛිත දැනුම්දීමක් බලපත්‍රලාභියා වෙත කරනු ලැබීමෙන් පසු සහ බලපත්‍රලාභියා විසින් එම කාලසීමාව තුළ එසේ හේතු දැක්වීමට අපොහොසත් වීම හෝ ප්‍රමාණවත් හේතු දැක්වීමක් නොකිරීම මත හැර, කරනු නොලැබිය යුතු ය.

**බලපත්‍රයක් අවලංගු කිරීම**

**8.** (1) 3 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් -

(අ) ව්‍යාජ, නොමඟ යවන සුලු හෝ වැරදි තොරතුරු ඉදිරිපත් කිරීමෙන් ලබාගෙන ඇති බවට හෙළි වන අවස්ථාවක දී;

(ආ) බලපත්‍රලාභියා මේ පනතේ විධිවිධාන යටතේ වන වරදකට වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක දී;

(ඇ) බලපත්‍රලාභියා විසින්, මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක යම් විධිවිධානයක් උල්ලංඝනය කරනු ලැබ ඇති අවස්ථාවක දී;

(ඈ) එකී බලපත්‍රය නිකුත් කරනු ලැබ ඇත්තේ යම් නියම හෝ කොන්දේසිවලට යටත්ව ද, බලපත්‍රලාභියා විසින් එකී නියම හෝ කොන්දේසි කඩ කරමින් හෝ උල්ලංඝනය කරමින් ක්‍රියාකරනු ලැබ ඇති අවස්ථාවක දී; හෝ

(ඉ) කන්ටේනර් මෙහෙයුම් දිගටම පවත්වාගෙන යාම මගින් මහජනයාට අහිතකර බලපෑමක් සිදුවන අවස්ථාවක දී,

අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අවලංගු කරනු ලැබිය යුතු ය.

(2) නිකුත් කරන ලද බලපත්‍රයක්, අවස්ථාවෝචිත පරිදි, 7 වන වගන්තිය යටතේ අත්හිටුවනු ලැබූ හෝ මේ වගන්තිය යටතේ අවලංගු කරනු ලැබූ අවස්ථාවක දී, බලපත්‍රලාභියා විසින් දෙන ලද ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන ලිඛිත සන්නිවේදනයක් මගින් එකී අත්හිටුවීම හෝ අවලංගු කිරීම පිළිබඳ බලපත්‍රලාභියාට දැනුම් දීම අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ කාර්යය විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වන අවලංගු කිරීමක්, එකී අවලංගු කිරීම සිදු නොකළ යුත්තේ මන්දැයි යන්න සම්බන්ධයෙන් වන හේතු, එකී දැනුම් දීමේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කාලසීමාවක් තුළ දක්වන ලෙසට වන ලිඛිත දැනුම්දීමක් බලපත්‍රලාභියා වෙත කරනු ලැබීමෙන් පසුව, සහ බලපත්‍රලාභියා විසින් එම කාලසීමාව තුළ එසේ හේතු දැක්වීමට අපොහොසත් වීම හෝ ප්‍රමාණවත් හේතු දැක්වීමක් නොකිරීම මත හැර, කරනු නොලැබිය යුතු ය.

(4) 7 වන වගන්තිය හෝ මේ වගන්තිය යටතේ බලපත්‍රයක් අත්හිටුවනු හෝ අවලංගු කරනු ලැබුයේ වුව ද, බලපත්‍රය අත්හිටුවනු ලැබූ හෝ අවලංගු කරනු ලැබූ කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරු විසින්, එම අත්හිටුවීමේ හෝ අවලංගු කිරීමේ සිට දින අනූවක් ඇතුළත, පවතින සමුද්‍ර කන්ටේනර්, ගනුදෙනුකරුවන් වෙත මුදා හැරීම කරගෙන යා හැකි ය.

සන්නිවේදනය කළ යුතු හේතු

**9.** අවස්ථාවෝචිත පරිදි, 3 වන හෝ 6 වන වගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අලුත් කිරීම සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති අවස්ථාවක දී, එකී ප්‍රතික්ෂේප කිරීම සඳහා වන හේතු අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් වාර්තා කරගත යුතු ය. ඉල්ලීමේ දැක්වෙන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන ලිඛිත සන්නිවේදනයක් මගින්, එකී ප්‍රතික්ෂේප වීම සඳහා වන හේතු, එකී ඉල්ලීම සිදු කරනු ලබන තැනැත්තා වෙත දැන්වීම අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ කාර්යය විය යුතු ය.

අභියාචන

**10.** (1) අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කරමින් ගනු ලබන තීරණයක් මගින්

හෝ නිකුත් කරන ලද බලපත්‍රයක් අත්හිටුවීම හෝ අවලංගු කිරීම මගින් අගතියට පත් වන යම් තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි, ප්‍රතික්ෂේප කිරීම හෝ අත්හිටුවීම හෝ අවලංගු කිරීම පිළිබඳ එකී තැනැත්තාට දන්වමින් එවන ලද ලිඛිත සන්නිවේදනය ලැබූ දිනයේ සිට දින තිහක් ඇතුළත, එකී තීරණයට එරෙහිව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක තීරණය, එකී අභියාචනය ලැබීමෙන් දින තිහක් ඇතුළත ගනු ලැබිය යුතු අතර, එම තීරණය පිළිබඳව එකී අභියාචනය ඉදිරිපත් කරන ලද තැනැත්තාට වහාම දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සුදුසු යැයි සලකනු ලබන අවස්ථාවක දී, (1) වන උපවගන්තිය යටතේ ඔහු වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් පිළිබඳ තීරණයකට එළඹීමට පෙරාතුව, අවස්ථානුගත කරුණු අනුව අවශ්‍ය යැයි සලකනු ලබන පරිදි විමර්ශනයක් ඔහු විසින් පවත්වනු ලැබිය හැකි ය.

## II වන කොටස

## සාමාන්‍ය විධිවිධාන

කන්ටේනර් ඩිපෝ ලියාපදිංචි කිරීම

**11.** (1) යම් තැනැත්තකු විසින්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ලියාපදිංචි කිරීමෙන් තොරව කිසිදු ආකාරයක සමුද්‍ර කන්ටේනර් ගබඩාවක් සුරක්ෂිත කිරීමේ කාර්යය සඳහා යම් ස්ථානයක් භාවිත නොකළ යුතු ය.

(2) යම් ආකාරයක සමුද්‍ර කන්ටේනර් ගබඩාවක් සුරක්ෂිත කිරීම සඳහා යම් ස්ථානයක් ලියාපදිංචි කිරීමට අදහස් කරනු ලබන තැනැත්තකු විසින්, තත්කාර්ය සඳහා නියම කරනු ලැබිය හැකි ආකෘතියකින් වන ඉල්ලීමක් අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) ඉල්ලීමක් ලැබීමෙන් පසු, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, (2) වන උපවගන්තිය යටතේ කරන ලද එවැනි ඉල්ලීමක අන්තර්ගත තොරතුරු සහ විස්තර සලකා බලා සහ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීම සඳහා වන සුදුසුකම් සම්බන්ධයෙන් 16 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ නියම කරනු ලැබ ඇති පරිදි ඉල්ලුම්කරුවකු විසින් සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා සම්පූර්ණ කරනු ලැබ ඇති අවස්ථාවක දී, ඉල්ලුම්කරු වෙත එම ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරනු ලැබිය යුතු ය.

අනුප්‍රමාණ සහ ගාස්තු

**12.** (1) අමාත්‍යවරයා විසින්, බලපත්‍රලාභී කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවකු විසින් සපයනු ලබන සේවා සඳහා අය කරනු ලැබිය යුතු අනුප්‍රමාණ සහ ගාස්තු නියම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වන එකී අනුප්‍රමාණ සහ ගාස්තු නිශ්චය කිරීමේ දී, අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කරුණු සැලකිල්ලට ගත යුතු ය:-

(අ) සේවය සැපයීමේ දී වැය කරන ලද පිරිවැය ආපසු අයකර ගැනීම සඳහා ඉඩ සලසන මට්ටමකින් එකී අනුප්‍රමාණ සහ ගාස්තු, සකසනු ලැබිය හැකි ය;

(ආ) 3 වන වගන්තිය යටතේ වන බලපත්‍රලාභී සමාගම් සහ සේවාව ලබාගන්නා තැනැත්තන් කෙරෙහි අසාධාරණ මූල්‍ය දුෂ්කරතා එකී අනුප්‍රමාණ, ගාස්තු මගින් නිර්මාණය නොවන බව සහතික කරමින්, සේවා ගාස්තු දැරිය හැකි බව පිළිබඳ සැලකිල්ල යොමු කළ හැකි ය;

(ඇ) එකී අනුප්‍රමාණ සහ ගාස්තු සාධාරණ විය යුතු අතර, විවිධ වර්ගයේ පරිශීලකයන් වෙත සපයනු ලබන සේවාවේ වටිනාකම එමගින් පිළිඹිබු විය යුතු ය;

(ඈ) 3 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී සමාගම්වල සහ සේවා ලබාගන්නා තැනැත්තන්ගේ ආදාන සඳහා සහ එකී අනුප්‍රමාණ ගාස්තු ගණනය කළ ආකාරය පිළිබඳ පැහැදිලි සන්නිවේදනයක් සඳහා වන අවස්ථා සලසමින් අනුප්‍රමාණ සහ ගාස්තු නිශ්චය කිරීම සඳහා වන ක්‍රියාවලිය විනිවිදභාවයකින් යුක්ත විය යුතු ය;

(ඉ) එකී අනුප්‍රමාණ සහ ගාස්තු මගින් සේවා සහ සම්පත් කාර්යක්ෂම ලෙස භාවිත කිරීම දිරිමත් කරනු ලැබිය යුතු ය; සහ

(ඊ) එකී අනුප්‍රමාණ සහ ගාස්තු කොළඹ වරායේ ගැඹුරු ජල පෙරටු බහාලුම් පර්යන්තයේ පවත්නා තීරු බදුවලට සහ සමාජයීය, ආර්ථික සහ පාරිසරික ඉලක්ක ඇතුළුව රජයේ පුළුල් ප්‍රතිපත්ති පරමාර්ථවලට සමගාමී විය හැකි ය.

(3) (අ) (1) වන උපවගන්තිය යටතේ නියෝග සෑදීමට පෙරාතුව, අමාත්‍යවරයා විසින්, 3 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී සමාගම් සහ උනන්දුවක් දක්වන වෙනත් පාර්ශ්ව විසින් අදහස් ඉදිරිපත් කිරීම උදෙසා යෝජිත අනුප්‍රමාණ සහ ගාස්තු අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය.

(ආ) නිල වෙබ් අඩවියේ පළ කිරීමෙන් දින තිහකට නොඅඩු කාල සීමාවක් ඉකුත් වීමේ දී, අමාත්‍යවරයා විසින්, 3 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී සමාගම් සහ උනන්දුවක් දක්වන වෙනත් පාර්ශ්ව විසින් එම කාලසීමාව තුළ සිදු කරන ලද ඉදිරිපත් කිරීම් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින්, එකී අනුප්‍රමාණ සහ ගාස්තු එකතු කිරීම සඳහා සහ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද එකී නියෝග ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා වන කාර්යපටිපාටිය නියම කරනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද නියෝග ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා වගකිව යුතු ය.

කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට විධාන නිකුත් කිරීම සඳහා බලතල

**13.** (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, බලපත්‍රලාභියකු මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානවලට අනුකූලව කටයුතු කරවීමේ කාර්ය සඳහා අවශ්‍ය යැයි ඔහු විසින් සලකනු ලැබිය හැකි සාමාන්‍ය හෝ විශේෂ විධාන ලිඛිතව බලපත්‍රලාභියා වෙත ලබා දිය හැකි ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, කන්ටේනර් ඩිපෝ මෙහෙයුම් ව්‍යාපාරය සම්බන්ධයෙන් වන වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු, ඔහු විසින් නියම කරනු ලැබිය හැකි ආකෘතියකින් ඔහු වෙත ඉදිරිපත් කරන ලෙසට ලිඛිතව බලපත්‍රලාභියාට විධාන කරනු ලැබිය හැකි ය.

(3) එකී විධානවලට අනුකූලව කටයුතු කිරීම එකී බලපත්‍රලාභියාගේ කාර්ය විය යුතු ය.

ඇතුළු වීම සහ පරීක්ෂා කිරීම සඳහා බලතල

**14.** අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් -

(අ) මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානවලට අනුකූල වූයේ ද යන්න තහවුරු කරගැනීමේ කාර්යය සඳහා, කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවකුගේ ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන පරිශ්‍ර වෙත, දහවල් හෝ රාත්‍රී සියලුම සාධාරණ කාලවල දී ඇතුළු වීම සහ පරීක්ෂා කිරීම; සහ

(ආ) කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවකුගේ යම් වාර්තා සහ එකී ව්‍යාපාරවලට අදාළ වෙනත් යම් වාර්තා පරීක්ෂා කිරීම සහ ඒවායේ පිටපත් ලබාගැනීම,

කරනු ලැබිය හැකි ය.

වාර්තා පවත්වාගෙන යාම

**15.** සෑම බලපත්‍රලාභියකු ම විසින්, නියම කරනු ලැබිය හැකි පරිදි වූ වාර්තා පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

නියෝග

**16.** (1) අමාත්‍යවරයා විසින්, නියම කළ යුතු යයි මේ පනතේ විධිවිධාන මගින් නියම කරනු ලැබ ඇති සියලුම කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට මේ පනත මගින් නියම කරන ලද හෝ බලය දෙන ලද සියලුම කාරණා සම්බන්ධයෙන් වන නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය මගින් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, අමාත්‍යවරයා විසින්, පහත දැක්වෙන යම් හෝ සියලු ම කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:-

(අ) මේ පනතේ විධිවිධාන යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරනු ලැබීමට යම් තැනැත්තකු සපුරාලිය යුතු සුදුසුකම්;

(ආ) යම් වර්ගයක සමුද්‍ර කන්ටේනරයක් ගබඩා කිරීමේ ස්ථානයේ යෝග්‍යතාවට අනුකූල අවශ්‍යතා;

(ඇ) බලපත්‍රය ලබා දිය හැකි කාලසීමාව සහ එය යටත් විය යුතු නියම සහ කොන්දේසි;

(ඈ) බලපත්‍රය සඳහා ඉල්ලුම් කරනු ලැබිය හැකි ක්‍රමය සහ ආකාරය;

(ඉ) මේ පනතේ සහ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානවලට අනුකූලවන බව තහවුරු කිරීම සඳහා අවශ්‍ය විය හැකි, කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවකුගේ ව්‍යාපාරවලට අදාළ ප්‍රකාශ සහ ප්‍රකාශන;

(ඊ) කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවකු විසින් අනුගමනය කරනු ලැබිය යුතු ප්‍රමිති සහ එකී ප්‍රමිති උල්ලංඝනය කරමින් සිදුකරනු ලබන ක්‍රියා හෝ පැහැර හැරීම් වාරණය කිරීම; සහ

(ඌ) බලපත්‍රලාභී කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන් අනුප්‍රමාණ සහ ගාස්තු අය කිරීම නිසි ලෙස සිදු කරන්නේ ද යන්න නිරීක්ෂණය කිරීමේ කාර්ය පටිපාටිය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එකී පළ කිරීමේ දින සිට හෝ නියෝගයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් පසු දිනයක සිට බලාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමෙන් මාස තුනක කාලයක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) නියෝගයක් පරිච්ඡින්න වූ බවට සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

ඒකාධිකාරය වරදක් බව

**17.** කන්ටේනර් ඩිපෝ මෙහෙයුම් ව්‍යාපාර කටයුතුවල දී තනිව හෝ ඒකාබද්ධව ඒකාධිකාරය කරනු ලබන බලපත්‍රලාභියකු විසින් වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරුවකු කරනු ලැබීමේ දී, රුපියල් මිලියන දහයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

වැරදි සහ දඬුවම්

**18.** මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධාන උල්ලංඝනය කරමින් ක්‍රියා කරනු ලබන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කිරීමෙන් අනතුරුව, රුපියල් මිලියන දහයක් නොඉක්මවන දඩයකට

හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හෝ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

**සංස්ථාපිත මණ්ඩල විසින් කරන ලද වරද සම්බන්ධයෙන් ඇතැම් තැනැත්තන්ගේ වගකීම**

**19.** පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනතේ විධිවිධාන යටතේ වරදක් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක දී, එම පුද්ගල මණ්ඩලය සංස්ථාපිත මණ්ඩලයක් නම්, වරද සිදු කරනු ලබන අවස්ථාවේ ඒ සංස්ථාපිත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු, සාමාන්‍යාධිකාරවරයකු, ලේකම්වරයකු හෝ වෙනත් යම් සමාන නිලධරයකු වූ සෑම තැනැත්තකු ම වරද සිදු කරන ලද්දේ ස්වකීය දැනීමකින් හෝ අනුදැනීමකින් තොරව බවට සහ ස්වකීය කර්තව්‍යවල ස්වභාවය සලකා බලා සහ සියලු ම අවස්ථාවල දී, එම වරද වළක්වා ගැනීමට සියලු නිසි උද්යෝගය යොදවන ලද බවට ඔප්පු කළහොත් මිස, ඒ වරද සිදු කරන ලද බවට සලකනු ලැබිය යුතු ය.

**අර්ථ නිරූපණය**

**20.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතේ -

"කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්" යන්නෙන්, ශ්‍රී ලංකාව තුළ කන්ටේනර් පර්යන්ත, කන්ටේනර් ඩිපෝ සහ කන්ටේනර් නැව් බඩු තබා ඇති ස්ථාන මෙහෙයවීමේ ව්‍යාපාරවල යෙදී සිටින සමාගමක් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 හෝ 44 වන ව්‍යවස්ථා ප්‍රකාරව වෙළෙඳ නැව් විෂයය පවරන ලද අමාත්‍යවරයා අදහස් වේ;

"ඒකාධිකාරය" යන්නෙන්, යම් තැනැත්තකු විසින් ව්‍යාපාර කරගෙන යාමේ දී, තනිව හෝ ඔහු සමඟ සම්බන්ධ වෙනත් තැනැත්තන් විසින් සිදු කරගෙන යනු ලබන ක්‍රියාකලාප පටිපාටිය ද සමඟ එක්ව, කන්ටේනර්

මෙහෙයුම්කරුවන්ගේ ව්‍යාපාර සමඟ වන තරගකාරීත්වය සීමා කිරීමේ, විකෘති කිරීමේ හෝ වැළැක්වීමේ බලපෑමක් සහිත හෝ එවැනි බලපෑමක් සිදු වෙතැයි අරමුණු කරනු ලබන හෝ එවැනි බලපෑමක් ඇතිවීමට ඉඩ ඇති ක්‍රියා පටිපාටියක් කරගෙන යෑම අදහස් වේ;

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කරන ලද යන්න අදහස් වේ; සහ

"ආරක්ෂාකාරී පියවර" යන්නට, කන්ටේනර් ඩිපෝවල මෙහෙයුම් ඒකාබද්ධතාවය පවත්වාගෙන යාමට, ගබඩා කරන ලද භාණ්ඩවල වටිනාකම ආරක්ෂා කිරීමට, සහ ඩිපෝ සේවක මණ්ඩලවල සහ අවට ප්‍රජාවගේ ආරක්ෂාව තහවුරු කිරීමට අත්‍යවශ්‍ය වන පියවර ඇතුළත් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**21.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.